පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ජනවාරි මාසය 03

ශ්‍රේණිය - 9

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන

පාසල - ර/නිවි/කරවිට මධ්‍ය විද්‍යාලය

Weekly School Department of Education, Sabaragamuwa Province

නිපුණතාවය :- පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.

නිපුණතා මට්ටම :- උද්භිත ගණයට අයත් සාම්ප්‍රධායික සැරසිලි ඒකක හා වර්ණ අධ්‍යනය කරයි.

ක්‍රියාකාරකම :- කුඩ රෙද්දක් නිර්මාණය කරමු.

පැවරුම :- පහත පියවර අනුව ක්‍රියාකාරකම කරන්න.

පියවර 01 :- විවිධ මෝස්තර යෙදූ කුඩ රෙදි කිහිපයක් සපයාගෙන ඒවායේ ඇති සුවිශේෂී බව අධ්‍යයනය කරන්න.

පියවර 02 :- කුඩ රෙද්දක් නිර්මාණයේදී එහි යොදා ඇති මෝස්තරය මධ්‍ය ලක්ෂයක සිට සෑම දිශාවකටම සමබරව විහිදී ඇති ආකාරය අවබෝධ කරගෙන ඒ සඳහා භාවිතා කර ඇති ශිල්පීය ක්‍රම නිරීක්ෂණය කරන්න.

පියවර 03 :- කවකටුව හා සරල දාරය යොදා ගනිමින් අරය අඟල් 4ක් වන වෘත්තයක් ඇඳ එමගින් ෂඩාස්‍රයක් නිර්මාණය කර ගන්න. අනතුරුව ෂඩාස්‍රයයේ සෑම මුල්ලක්ම කේන්ද්‍රයට යාවන පරිදි කොටස් හයකට බෙදා ගනී.

පියවර 04 :- එම බෙදාගත් එක් දිගටි ත්‍රිකෝණාකාර හැඩයට මල් කොළ ආශ්‍රයෙන් සරල සැරසිල්ලක් යොදන්න අනතුරුව එය අනෙකුත් සියලුම හැඩ සඳහා ට්‍රේෂූ කඩදාසි යොදා ගනිමින් යොදන්න.

පියවර 05 :- ඉහත සියල්ල අවසානයේ අලංකාර කුඩ රෙදි සැලසුමක් නිර්මාණය වේ එය ගැලපෙන වර්ණ යොදා ගනිමින් සුදුසු පරිදි වර්ණ කරන්න.